7 ඒකකය
ශාක ප්‍රචාරණය

(1) පරාගණය යනු,

1) පරාගධානියේ සිදුවන ඌනන විභාජනය වේ.
2) කලංකය මත පරාග කණිකා තැන්පත් වීම වේ.
3) කලංකය මත පරාග කණිකා ප්‍රරෝහණය වීම වේ.
4) පුං න්‍යෂ්ටිය මගින් ඩිම්බය සංසේචනය වීම වේ.
5) සංසේචිත ඩිම්බය, කලලයක් බවට වර්ධනය වීම වේ. (2000)

(2) අතු බැඳීමේ දී,

1) මුල් ඇදීම බලාපොරොත්තු වන ස්ථානයට ඉහළින් පොත්ත ඉවත් කළ යුතු ය.
2) පොත්ත ඉවත් නොකළ යුතු නමුත් අත්තෙහි ඇති පත්‍රවලින් අඩක් ඉවත් කළ යුතු ය.
3) මුල් ඇදීම බලාපොරොත්තු වන ස්ථානයට පහළින් පොත්ත ඉවත් කළ යුතු ය.
4) පොත්ත හා අත්තෙහි පත්‍රවලින් අඩක් ඉවත් කළ යුතු ය.
5) අත්තෙහි ඇති පත්‍ර සියල්ල ඉවත් කළ යුතු ය. (2000)

(3) පහත දී ඇති ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,

1) බීජ සුප්තතාව, නව ප්‍රභේදවල බහුල ය.
2) බීජ සුප්තතාව, සෑම විටකම කෘෂිකාර්මික කටයුතුවලට බාධකයකි.
3) බීජ සුප්තතාව, යනු විශාලම ක්ෂේත්‍රයක පැතිරීම සඳහා ශාක දක්වන අනුවර්තනයකි.
4) සුප්ත බීජ ජීව්‍යතාවයෙන් තොර ය.
5) සුප්ත බීජ මනුෂ්‍ය පරිභෝජනයට සුදුසු නැත. (2000)

(4) ශාකවල පැවැත්ම සඳහා බීජ වැදගත් වනුයේ,
1) එමඟින් ශාක ගුණනය විය හැකි නිසා ය.
2) ඒවායේ ඇති අහිතකර තත්ත්ව මඟ හැරීමේ හැකියාව නිසා ය.
3) ඒවායේ ඇති ව්‍යාප්ති වීමේ හැකියාව නිසා ය.
4) ඉහත 1, 2 හා 3 නිසා ය.
5) බීජාවරණය නිසා ය. (2000)

(5) බීජ ජීවානුහරණය,
A) බීජ ප්‍රතිකාරකයක් ලෙස සැලකේ.
B) බීජ මඟින් පැතිරෙන රෝග හා පලිබෝධ වැළැක්වීම සඳහා සිදු කරනු ලැබේ.
C) ප්‍රරෝහණයේ මුල් අවස්ථාවල දී පෝෂක ලබාදීම සඳහා සිදු කරනු ලැබේ.
D) අධෝභෞම ප්‍රරෝහණයක් සහිත බීජ සඳහා පමණක් සිදු කරනු ලැබේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ,
1) A හා B පමණි. 2) A හා C පමණි. 3) A හා D පමණි.
4) B හා C පමණි. 5) B හා D පමණි. (2000)

(6) බීජ සහතික කිරීමේ දී සලකනු ලබන ප්‍රධාන සාධක වනුයේ,
1) ප්‍රරෝහණ ප්‍රතිශතය, බීජ දහසක බර හා පිරිසිදු බව වේ.
2) ප්‍රරෝහණ ප්‍රතිශතය, තෙතමන ප්‍රතිශතය හා බීජ වර්ණය වේ.
3) තෙතමන ප්‍රතිශතය, පිරිසිදු බව හා බීජ දහසක බර වේ.
4) පිරිසිදු බව, බීජ වර්ණය හා තෙතමන ප්‍රතිශතය වේ.
5) තෙතමන ප්‍රතිශතය, ප්‍රරෝහණ ප්‍රතිශතය හා පිරිසිදු බව වේ. (2000)

(7) පහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ,
1) ක්ෂුද්‍ර ප්‍රචාරණය, අනෙකුත් බහුල ප්‍රචාරණ ක්‍රමවලට වඩා වියදම් අඩු ක්‍රමයකි.
2) ක්ෂුද්‍ර ප්‍රචාරණයේ දී දෛහික ක්ලෝන විචලතාවය ඇති වේ.
3) ක්ෂුද්‍ර ප්‍රචාරණය, පලතුරු බෝග ගුණනය කිරීම සඳහා වඩාත් සුදුසු වේ.
4) ක්ෂුද්‍ර ප්‍රචාරණය සඳහා ශ්‍රමය විශාල වශයෙන් අවශ්‍ය වේ.
5) ක්ෂුද්‍ර ප්‍රචාරණය මඟින් රෝගවලින් තොර ශාක ලබාගත හැක. (2000)

(8) සුප්ත බීජවල ජීව්‍යතාවය නිර්ණය කළ හැක්කේ,
1) පෙට්‍රිදීසි ක්‍රමයෙනි. 2) රැග්ඩෝල් ක්‍රමයෙනි.
3) තවාන් පෙට්ටි ක්‍රමයෙනි. 4) ටෙට්‍රාසෝලියම් ක්ලෝරයිඩ් ක්‍රමයෙනි.
5) ඉහත කිසිවකින් නොවේ. (2001)

(9) පරපරාගණයට දක්වන අනුවර්තනයක් වනුයේ,
1) ද්විලිංගික පුෂ්ප පිහිටීම ය. 2) සංයුක්ත ඒකාක්ෂයක් පිහිටීම ය.
3) ද්විගෘහතාව (Dioecism) ය. 4) විසංයෝගීතාව (Apomixis) ය.
5) කුඩා කලංකයක් පිහිටීම ය. (2001)

(10) බීජ සුප්තතාවය ඉවත් කළ හැක්කේ,
1) බීජ ජීවානුහරණය මඟිනි. 2) බීජ ආවරණය කිරීමෙනි. 3) බීජ සීරීමෙනි.
4) බීජ ආමුකුලනය කිරීමෙනි. 5)ඉහත කිසිවකින් නොවේ. (2001)

(11) සුප්ත බීජ,
1) ජීව්‍ය වන අතර ප්‍රරෝහණයට අවශ්‍ය බාහිර තත්ත්ව ලබා දුන් විට ප්‍රරෝහණය වේ.
2) ජීව්‍ය වන නමුත් ප්‍රරෝහණයට අවශ්‍ය බාහිර තත්ත්ව ලබා දුන් විට ප්‍රරෝහණය නොවේ.
3) ජීව්‍ය වන අතර බීජ ජීවානුහරණය කිරීමෙන් පසුව පමණක් ප්‍රරෝහණය වේ.
4) අජීව්‍ය වන අතර බීජ සීරීමෙන් පසුව ද ප්‍රරෝහණය නොවේ.
5) අජීව්‍ය වන අතර අම්ල ප්‍රතිකාරයෙන් පසුව ද ප්‍රරෝහණය නොවේ. (2001)

(12) MS (Murashige and Skoog) මාධ්‍යය යනු,
1) ශාක හෝර්මෝනයකි. 2) පටක රෝපණ මාධ්‍යයකි. 3) ශාක වර්ධක යාමකයකි.
4) දියර පොහොරකි. 5) දිලීර නාශකයකි. (2001)

(13) කෘතිම බීජ නිපදවීමේ දී විජලනය කළ කලලක (Dehydrated embroids) වට කරනු (Encapsulate) ලබනුයේ,
1) සෝඩියම් ඇල්ජිනේට් වලිනි.
2) කැල්සියම් නයිට්‍රේට් වලිනි.
3) කැල්සියම් ඇල්ජිනේට් වලිනි.
4) සෝඩියම් ක්ලෝරයිඩ් වලිනි.
5) කැල්සියම් ක්ලෝරයිඩ් වලිනි. (2001)

(14) වී බීජවල තෙතමන ප්‍රතිශතය සෙවීමේ පරීක්ෂණයක දී පහත දත්ත ලැබුණි.
බීජ නියැදියේ මූලික බර = 200g
බීජ නියැදිය නියත බරකට වියළීමෙන් පසු බර = 180g
වී බීජ නියැදියේ තෙතමන ප්‍රතිශතය වනුයේ,
1) 0.1% වේ.
2) 1.0% වේ.
3) 10.0% වේ.
4) 1.11% වේ.
5) 11.1% වේ. (2001)

(15) බීජ ප්‍රතිකාර කිරීමේ පරමාර්ථ සමහරක් පහත දක්වේ.
A) බීජ ජීවාණුහරණය.
B) මැරුණු බීජ ඉවත් කිරීම.
C) රෝග හා පළිබෝධ හානි අවම කිරීම.
D) බීජ සුප්තතාව ඉවත් කිරීම.
ඉහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ,
1) A හා C පමණි.
2) A, B හා C පමණි.
3) A,C හා D පමණි.
4) B, C හා D පමණි.
5) A, B, C හා D යන සියල්ලමය. (2002)

(16) ලා කොළ පැහැති ලේබලයක් සහිත බීජ තොගයක් ගොවියෙකුට ලැබිණි. මෙම බීජ,
1) අභිජනන බීජ වේ.
2) අත්තිවාරම් බීජ වේ.
3) ලියාපදිංචි බීජ වේ.
4) සහතික කළ බීජ වේ.
5) F_1 බීජ වේ. (2002)

(17) පටක රෝපණ මාධ්‍යයකට සුක්රෝස් එකතු කරනුයේ,
1) වර්ධක යාමකයක් වශයෙනි.
2) අකාබනික පෝෂකයක් වශයෙනි.
3) ජෙලටීනිකාරකයක් වශයෙනි.
4) ස්වාරක්ෂකයක් වශයෙනි.
5) ශක්ති ප්‍රභවයක් වශයෙනි. (2002)

(18) රෝගවලින් තොර රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමට වඩාත් සුදුසු ප්‍රචාරක ක්‍රමය වනුයේ,
1) අංකුර බද්ධයයි.
2) රිකිලි බද්ධයයි.
3) ක්ෂුද්‍ර ප්‍රචාරණයයි.
4) බීජ ප්‍රචාරණයයි.
5) ක්ලෝනකරණයයි. (2002)

(19) පරපරාගණයට අනුවර්තනයක් වනුයේ,
1) විවෘත නොවූ පුෂ්ප වේ.
2) ස්ව – අසංගතිය වේ.
3) ඒකගෘහිතාව වේ.
4) ද්විලිංගික පුෂ්ප වේ.
5) විසංයෝගතාව වේ. (2002)

(20) ද්විබීජපත්‍රී බීජ පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
1) ඵලාවරණය බීජ පත්‍රවලට තදින් බැඳී ඇත.
2) වර්තිකාවෙහි ආහාර තැන්පත් වී ඇත.
3) බීජ ලපය හා අනුද්වාරය දැකිය නොහැකිය.
4) මේරූ බීජවල භ්‍රෑණපෝෂය දැකිය නොහැකිය.
5) බීජ පත්‍ර දැකිය නොහැකිය. (2002)

(21) බීජ ප්‍රරෝහණයේ අනුපිළිවෙල නිවැරදිව දැක්වෙන්නේ පහත කුමන පිළිතුරේ ද?
1) එන්සයිම ක්‍රියාත්මකවීම, බීජාවරණ පිපිරීම, සෛල විභාජනය ආරම්භවීම, සංචිත ආහාර ජලවිච්ඡේදනය වීම, බීජ පැළය මතුවීම.
2) බීජාවරණ පිපිරීම, වර්ධනය ආරම්භ වීම, එන්සයිම ක්‍රියාත්මක වීම, සංචිත ආහාර ජලවිච්ඡේදනය වීම, බීජ පැළය මතුවීම.
3) වර්ධනය ආරම්භ වීම, ජලය අවශෝෂණය, සංචිත ආහාර ජලවිච්ඡේදනය වීම, එන්සයිම ක්‍රියාත්මක වීම, සෛල විභාජනය ආරම්භවීම බීජ පැළය මතුවීම.
4) ජලය අවශෝෂණය, එන්සයිම ක්‍රියාත්මක වීම, සංචිත ආහාර ජලවිච්ඡේදනය, වර්ධනය ආරම්භ වීම, බීජාවරණ පිපිරීම, බීජ පැළය මතුවීම.
5) සංචිත ආහාර ජලවිච්ඡේදනය, ජලය උරා ගැනීම, බීජාවරණ පිපිරීම, සෛල විභාජනය ආරම්භවීම, බීජ පැළය මතුවීම. (2002)

➢ බීජයක අඩංගු ප්‍රධාන කොටස් පහත දැක්වේ. අංක 22, 23 සහ 24 ප්‍රශ්නවලට පිළිතුරුදීම සඳහා මේවා යොදාගන්න.

A) බීජපත්‍ර | B) බීජාග්‍රපය
C) බීජමූලපය (Coleorhiza) | D) බීජලපය (Hilum)
E) බීජාවරණය | F) භ්‍රෑණපෝෂය
G) ජේවනිය | H) අනුද්වාරය

(22) ඉහත දැක්වෙන කොටස්වලින් කලලයෙහි කොටස් වනුයේ,
1) A,B සහ C පමණි. 2) A,D සහ E පමණි. 3) A,F සහ G පමණි.
4) A සහ H පමණි. 5) A සහ F පමණි. (2003)

(23) ඉහත දැක්වෙන කොටස්වලින් මාතෘ පටකයේ කොටසක් වනුයේ,
1) B ය. 2) C ය. 3) D ය. 4) E ය. 5)F ය. (2003)

(24) බීජ ජලය අවශෝෂණය කරනුයේ,
1) B හරහා ය. 2) C හරහා ය. 3) D හරහා ය.
4) G හරහා ය. 5) H හරහා ය. (2003)

(25) බීජ ආවරණය (Seed Coating) කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ,
1) බීජ සුප්තතාව ඉවත් කිරීමයි. 2) බීජ ජීවානුහරණය කිරීමයි.
3) ඒකාකාරී හැඩයකින් යුත් බීජ ලබා ගැනීමයි. 4) බීජ දැඩි බවට පත් කිරීමයි.
5) බීජ ආමුඛුලනය කිරීමයි. (2003)

(26) එක්තරා ශාකයක පරාග, එම ශාකයේම හටගත් පුෂ්පවල පිහිටි කලංක මත දී ප්‍රරෝහණය නොවේ. මෙම තත්වය හඳුන්වන්නේ,
1) ස්වඅසංගතිය යනුවෙනි. 2) ස්වපරාගණය යනුවෙනි. 3) ස්වවන්ධ්‍යතාව යනුවෙනි.
4) ස්වයාමනය යනුවෙනි. 5) ස්වපරපෝෂිතාව යනුවෙනි. (2003)

(27) පටක රෝපණයේ දී තල ප්‍රවාහ කැබිනෙට්ටුව භාවිත කරනුයේ,
1) රෝපණ කුටියේ උෂ්ණත්වය සහ ආර්ද්‍රතාව පාලනය කිරීමට ය.
2) රෝපණ මාධ්‍යය සාදා ගැනීමට ය.
3) රෝපණ මාධ්‍යයට පටක මාරු කිරීමට ය.
4) ඛනිජ ඉවත් කරන ලද ජලය ලබා ගැනීමට ය.
5) රෝපණ කුටියට අවශ්‍ය තරම් ආලෝකය ලබා ගැනීමට ය. (2003)

(28) බීජ ප්‍රරෝහණ පරීක්ෂණයක දී බීජ 400 ක් ප්‍රරෝහකයක (GERMINATOR) තැනපත් කරන ලදී. දින 4 – 5 කට පසුව පැළවුණු බීජ ප්‍රමාණය බීජ 352 ක් බව සොයාගන්නා ලදී. බීජ සාම්පලයේ ප්‍රරෝහණ ප්‍රතිශතය වනුයේ,
1) 12% කි. 2) 13.6% කි. 3) 86.4% කි. 4) 88% කි. 5) 100% කි. (2003)

(29) තනි මාතෘ ශාකයකින් වර්ධකව ප්‍රචාරණය කළ ශාක ගහණයක් වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,
1) ප්‍රභේදයක් ලෙස ය. 2) ප්‍රවේණි දර්ශයක් ලෙස ය.
3) වසා දර්ශකයක් (eco – type) ලෙස ය. 4) ක්ලෝනයක් ලෙස ය.
5) ජෛව දර්ශයක් ලෙස ය. (2004)

(30) ද්විගෘහිතාව අනුවර්තනයක් ලෙස සලකන්නේ,
1) විසංයෝගීතාව (apomixis) සඳහා ය. 2) ස්වපරාගණය සඳහා ය.
3) පරපරාගණය සඳහා ය. 4) කෞමාරෝද්භවය (parthenogenesis) සඳහා ය.
5) වර්ධක ප්‍රචාරණය සඳහා ය. (2004)

(31) කැල්සියම් ඇල්ජිනේට්වලින් වට කළ විජලනය කළ කලලක (embroids) හඳුන්වන්නේ,
1) සහශු බීජ ලෙස ය. 2) දෙමුහුම් බීජ ලෙස ය.
3) ජාන විකරණය කළ බීජ ලෙස ය. 4) කෘතිම බීජ ලෙස ය.
5) අභිජනක බීජ ලෙස ය. (2004)

(32) බීජ ගබඩා කිරීමට වඩාත් සුදුසු තත්ත්ව වනුයේ,
1) අඩු උෂ්ණත්වය හා ආර්ද්‍රතාවයයි.
2) අඩු ආලෝක තීව්‍රතාව හා ආර්ද්‍රතාවයයි.
3) අඩු ආලෝක තීව්‍රතාව හා උෂ්ණත්වයයි.
4) අඩු වාතනය හා ආර්ද්‍රතාවයයි.
5) අඩු වාතනය හා උෂ්ණත්වයයි. (2004)

(33) ද්විබීජපත්‍රී බීජවල,
1) පරිණත අවස්ථාවේ දී භ්‍රෑණපෝෂය දැකිය නොහැකි ය.
2) බීජ පත්‍ර ක්ෂීණ වූ පටක බවට පත් වී ඇත.
3) බීජ ලපය හා අනුද්වාරය දැකිය නොහැකි ය.
4) බීජ පත්‍ර වර්ජිකාව ලෙස හැඳින් වේ.
5) ඵලාවරණය බීජයට තදින් සම්බන්ධ වී පවතී. (2004)

(34) බීජ සුප්තතාව බිඳිය හැක්කේ,
1) ආමුකුලනයෙනි.
2) බීජ දැවටීමෙනි.
3) සීරීමෙනි.
4) ජීවානුහරණය කිරීමෙනි.
5) පිරිසිදු කිරීමෙනි. (2004)

(35) ශාක ප්‍රවර්තනය (පැවැත්ම) සඳහා බීජ වැදගත් වන්නේ,
A) ඒවායේ බහුගුණන (multiply) හැකියාව නිසා ය.
B) ඒවායේ ව්‍යාප්ත කිරීමේ හැකියාව නිසා ය.
C) ඒවාට අහිතකර තත්ත්ව මඟ හැරීමට ඇති හැකියාව නිසා ය.
මේ අතරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශය වනුයේ,
1) A පමණි.
2) B පමණි.
3) C පමණි.
4) A සහ Bපමණි.
5) A,B සහ C යන සියල්ලම ය. (2004)

(36) බීජ සාම්පලයක තෙතමන ප්‍රතිශතය සෙවීමෙ පරීක්ෂණයක දී ලබාගත් දත්ත පහත දක්වේ.
බීජ සාම්පලයේ ආරම්භක බර = ග්‍රෑම 100
බීජ සාම්පලය නියත බරකට වියැළීමෙන් පසු එහි බර = ග්‍රෑම 90
මේ අනුව බීජ සාම්පලයේ තෙතමන ප්‍රතිශතය,
1) 0.1%
2) 1.0%
3) 1.11%
4) 10%
5) 11.1% (2004)

(37) ශාකවල ද්විගෘහතාව (dioecy) අනුවර්තනයක් වනුයේ,
1) පර පරාගණය සඳහා ය.
2) ස්වපරාගණය සඳහා ය.
3) අලිංගික ප්‍රචාරණය සඳහා ය.
4) සහාභිජනනය (imbreeding) සඳහා ය.
5) කෘමි පරාගණය සඳහා ය. (2005)

(38) සුප්ත බීජවල ජීව්‍යතාව නිර්ණය කළ හැක්කේ,
1) අම්ල ප්‍රතිකාර ක්‍රමයෙනි.
2) රැග්ඩෝල් ක්‍රමයෙනි.
3) ටෙට්‍රාසෝලියම් ක්ලෝරයිඩ් ක්‍රමයෙනි.
4) තවාන් පෙට්ටි ක්‍රමයෙනි.
5) පෙට්‍රි දීසි ක්‍රමයෙනි. (2005)

(39) බීජ ගොවිපොළක ගොවිපොළ කළමනාකරුවෙකුට ලා කොළ පැහැති ලේබලයක් සහිත බීජ තොගයක් ලැබිණි. මෙම බීජ තොගය,
1) අභිජනන බීජ වේ.
2) අත්තිවාරම් බීජ වේ.
3) ලියාපදිංචි කළ බීජ වේ.
4) සහතික කළ බීජ වේ.
5) දෙමුහුම් බීජ වේ. (2005)

(40) ශ්‍රී ලංකාවේ දියගත වගාවේ දී (hydroponics) වඩාත් බහුලව යොදා ගන්නා රෝපණ මාධ්‍යය වනුයේ,
1) මුරෑෂිගේ හා ස්කූග් (Muashige and Skoog) මාධ්‍යයයි.
2) B_5 මාධ්‍යයයි.
3) සච්ගේ (Sach's) ද්‍රාවණයයි.
4) ඇල්බට්ගේ (Albert's) ද්‍රාවණයයි.
5) නොප්ගේ (Knop's)ද්‍රාවණයයි. (2005)

(41) එක්තරා බෝගයක බීජ එහි ඇති තද බීජාවරණය නිසා සුප්ත තත්ත්වයේ පවතින බව ශිෂ්‍යයෙක් දැන ගත්තේය. මෙම තත්ත්වය වඩාත් හොඳින් පැහැදිලි කළ හැක්කේ,
1) පැවරූ සුප්තතාව (imposed dormancy) ලෙස ය.
2) භෞතික සුප්තතාව ලෙස ය.
3) රසායනික සුප්තතාව ලෙස ය.
4) රූපානු විද්‍යාත්මක සුප්තතාව ලෙස ය.
5) කායික විද්‍යාත්මක සුප්තතාව ලෙස ය. (2005)

(42) වයිරස්වලින් තොර රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා වඩාත් සුදුසු රෝපණ ක්‍රමය වනුයේ,
1) රෝගවලින් තොර ශාකයක් සමග අංකුර බද්ධ කිරීම යි.
2) රෝගවලින් තොර ශාකයක් සමග රිකිලි බද්ධ කිරීම යි.
3) අග්‍රස්ථ අංකුරය ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීම ය.
4) බීජ මඟින් ප්‍රචාරණය කිරීම ය.
5) අතු කැබලි මඟින් ප්‍රචාරණය කිරීම ය. (2005)

➢ **අංක 43, 44 හා 45 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන බීජයක රූප සටහන උපයෝගී කර ගන්න.**



(43) කලලයේ කොටස් වනුයේ,
1) A, B හා C පමණි.
2) B, C හා D පමණි.
3) A, B, C හා D පමණි.
4) C, D හා E පමණි.
5) C, D, E හා F පමණි. (2006)

(44) මාතෘ පටකයේ කොටසක් වනුයේ,
1) A 2) B 3) C 4) D 5) E (2006)

(45) බීජයේ ත්‍රිගුණ (3n) පටකය වනුයේ,
1) A 2) B 3) C 4) D 5) E (2006)

(46) පටක රෝපණ මාධ්‍යයක් සැකසීමෙන් පසු එය පීඩන උදුනක හෝ පීඩ තාපකයක (autoclave) හෝ තබා අධික උෂ්ණත්වයට භාජනය කරනු ලැබේ. මෙය සිදු කරනුයේ,
1) මාධ්‍යයේ ඇති කාබනික පෝෂක දියකර ගැනීම සඳහා ය.
2) පොලිසැකරයිඩ, මොනොසැකරයිඩ බවට ජලවිච්ඡේදනය කර ගැනීම සඳහා ය.
3) මාධ්‍යයේ ඇති විෂබීජ නැසීම සඳහා ය.
4) හෝර්මෝන සක්‍රිය කිරීම සඳහා ය.
5) ඒගාර් ඝනකර ගැනීම සඳහා ය. (2006)

➢ **අංක 47 ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට පහත රූප සටහන යොදා ගන්න.**



(47) ඉහත රූප සටහන සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
1) "A"අධෝභෞම ප්‍රරෝහණයක් පෙන්වන අතර "B"අපිභෞම ප්‍රරෝහණයක් පෙන්වයි.
2) "A" අපිභෞම ප්‍රරෝහණයක් පෙන්වන අතර "B" අධෝභෞම ප්‍රරෝහණයක් පෙන්වයි.
3) "A" හා "B" දෙකම අධෝභෞම ප්‍රරෝහණයක් පෙන්වයි.
4) "A" හා "B" දෙකම අපිභෞම ප්‍රරෝහණයක් පෙන්වයි.
5) "A" හි බීජ ආමුකුලනය කර නැති අතර "B" හි බීජ රයිබෝසියම් මඟින් ආමුකුලනය කර ඇත. (2006)

(48) සුප්තතාව පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A) බීජවල ඇති වේ.
B) බල්බවල හා අංකුරවල ඇති වීමට ඉඩ තිබේ.
C) අහිතකර පරිසර තත්වවලින් බේරීමට බීජවලට උපකාරී වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ,
1) A පමණි. 2) A හා B පමණි. 3) A හා C පමණි.
4) B හා C පමණි. 5) A,B හා C සියල්ලම ය. (2006)

(49) ශිෂ්‍යයෙකුට තමා සතු බීජ නියැදියක ජීව්‍යතාව පරීක්ෂා කිරීමට අවශ්‍ය විය. එහෙත් බීජ නියැදියේ සුප්තතාව පිළිබඳ කිසිම තොරතුරක් ඔහු සතුව නොතිබිණි. මෙම බීජ නියැදියේ ජීව්‍යතාව පරීක්ෂා කිරීමට වඩාත්ම සුදුසු ක්‍රමය වනුයේ,
1) පෙට්‍රි දීසි ක්‍රමයයි. 2) රැගඩෝල් ක්‍රමයයි. 3) තවාන් පෙට්ටි ක්‍රමයයි.
4) උණුසුම් ජල ප්‍රතිකාර ක්‍රමයයි. 5) ටෙට්‍රාසෝලියම් ක්ලෝරයිඩ් ක්‍රමයයි. (2007)

(50) ශිෂ්‍යයෙකුට බීජ නියැදියක තෙතමන ප්‍රතිශතය නිර්ණය කිරීමට අවශ්‍ය විය. ඔහු පහත නිරීක්ෂණ සිදු කළේ ය.
බීජ නියැදියේ ආරම්භක බර = 300g
නියත බරකට වියළීමෙන් පසු බීජ නියැදියේ බර = 270g
බීජ නියැදියේ තෙතමන ප්‍රතිශතය වනුයේ,
1) 10.0% 2) 11.1% 3) 30.0% 4) 60.0% 5) 90.0% (2007)

(51) ශිෂ්‍යයෙක් එක්තරා ශාකයක පුෂ්පයකින් එකතුකරගත් පරාග, එම ශාකයේම වෙනත් පුෂ්පයක කලංකය මත පරෙස්සමින් තැන්පත් කළේය. මෙම ක්‍රියාවලිය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,
1) ස්ව සංසේචනය ලෙස ය. 2) පර සංසේචනය ලෙස ය. 3) ස්ව පරාගණය ලෙස ය.
4) පර පරාගනය ලෙස ය. 5) දෙමුහුම්කරණය ලෙස ය. (2007)

(52) MS (Murashige and Skoog) මාධ්‍යය සලකනු ලබන්නේ,
1) දිලීර නාශකයක් ලෙස ය. 2) කෘමි නාශකයක් ලෙස ය.
3) පටක රෝපණ මාධ්‍යයක් ලෙස ය. 4) ශාක වර්ධක යාමකයක් ලෙස ය.
5) දියර පොහොරයක් ලෙස ය. (2007)

(53) විජලනය කළ දෛහික කලලක, කැල්සියම් ඇල්ජිනේට් මඟින් ආවරණය (encapsulate) කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය හැඳින්වෙන්නේ,
1) දෙමුහුම් බීජ නිෂ්පාදනය ලෙස ය. 2) කෘත්‍රිම බීජ නිෂ්පාදනය ලෙස ය.
3) සහතික කළ බීජ නිෂ්පාදනය ලෙස ය. 4) ආන්තික (terminator) බීජ නිෂ්පාදනය ලෙස ය.
5) ජාන විකිරණය කළ බීජ නිෂ්පාදනය ලෙස ය. (2007)

(54) ක්වීනීන් (Quinine) ලබා ගනුයේ,
1) කෝමාරිකා (Aloe vera) වලිනි. 2) දුම්කොළ (Nicotiana tabacum) වලිනි.
3) කොහොඹ (Azadirachta indica) වලිනි. 4) සින්කෝනා (Cinchona ledgeriana) වලිනි.
5) මිංචි (Mentha arnensis) වලිනි. (2007)

(55) බීජ සුප්තතාව බිඳ දැමීමේ ක්‍රමවලට උදාහරණ වනුයේ,
1) බීජ ජීවාණුහරණය හා බීජ සීරීමයි. 2) බීජ ආවරණය කිරීම හා අම්ල ප්‍රතිකාර කිරීමයි.
3) බීජ දැඩි කිරීම හා උණු ජල ප්‍රතිකාරයයි. 4) බීජ ජීවාණුහරණය කිරීම හා ජල ආවරණය කිරීමයි.
5) බීජ සීරීම හා උණු ජල ප්‍රතිකාරයයි. (2007)

(56) ශාකවල පැවැත්මට බීජ වැදගත් වනුයේ ඒවායේ ඇති,
1) ව්‍යාප්ත වීමේ හා අහිතකර තත්ත්ව මඟ හරවා ගැනීමේ හැකියාව නිසා ය.
2) ව්‍යාප්ත වීමේ හැකියාව හා තද බීජාවරණයක් තිබීම නිසා ය.
3) අහිතකර තත්ත්ව මඟ හරවා ගැනීමේ හැකියාව හා දීර්ඝ සුප්ත කාලය නිසා ය.
4) තද බීජාවරණය හා දීර්ඝ සුප්ත කාලය නිසා ය.
5) හැඩය, තද බීජාවරණය හා දීර්ඝ සුප්ත කාලය නිසා ය. (2007)

(57) බීජ, ජලය අවශෝෂණය කරනු ලබන්නේ,
1) බීජාග්‍රපයෙනි. 2) බීජ මූලයෙනි. 3) බීජ ලපයෙනි.
4) සේචනියෙනි. 5) අනුද්වාරයෙනි. (2008)

(58) සංසේචනයෙන් තොරව ඵල හටගැනීම හඳුන්වනුයේ,
1) බහුයෝගීතාව (Polygamy) ලෙස ය. 2) පාතනෝඵලනය (Parthenocarpy) ලෙස ය.
3) ජලාබුජතාව (viviparity) ලෙස ය. 4) විසංයෝගීතාව (apomixes) ලෙස ය.
5) නිමලයෝගීතාව (cleistogamy) ලෙස ය. (2008)

(59) ක්ෂුද්‍ර ප්‍රචාරණය,
1) අනෙකුත් ප්‍රකට ප්‍රචාරණ ක්‍රමවලට වඩා වියදම අඩු ය.
2) දෛහික ක්ලෝන විචලතාව දක්වයි.
3) කුඩා බීජ සහිත බෝග ප්‍රචාරණය සඳහා වඩාත් සුදුසු ය.
4) සඳහා විශාල වශයෙන් ශ්‍රමය අවශ්‍ය වේ.
5) වෛරස රහිත රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා භාවිත වේ. (2008)

(60) ශාකවල ද්විගෘහතාව අනුවර්තනය වී ඇත්තේ,
1) පරපරාගණය සඳහා ය. 2) අලිංගික ප්‍රජනනය සඳහා ය.
3) කෘමි පරාගණය සඳහා ය. 4) ස්ව පරාගණය සඳහා ය.
5) ස්වාභිජනනය සඳහා ය. (2008)

(61) ද්විබීජපත්‍රී බීජ සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ කුමක් ද?
1) ඵලාවරන බීජවලට තදින් සම්බන්ධ වී ඇත.
2) බීජපත්‍ර වර්ථිකාව ලෙස හැඳින් වේ.
3) බීජ ලපය හා අනුද්වාරය දක්නට නැත.
4) බීජපත්‍ර අල්ප විකසිත පටකයක් බවට පත් වී ඇත.
5) පරිණත බීජයක භ්‍රෑණපෝෂය දක්නට නැත. (2008)

(62) බීජ සුප්තතාව වඩාත් හොඳින් නිර්වචනය වනුයේ,
1) ප්‍රරෝහණය සඳහා යහපත් පරිසර තත්ත්ව ලැබෙන තෙක් ප්‍රරෝහණය නොවන ජීව්‍ය බීජ ලෙස ය.
2) ප්‍රරෝහණය සඳහා යහපත් තත්ත්ව ලැබුණ ද ප්‍රරෝහණය නොවන ජීව්‍ය බීජ ලෙස ය.
3) තද බීජාවරණය නිසා ප්‍රරෝහණය නොවන ජීව්‍ය බීජ ලෙස ය.
4) බීජ සීරීමෙන් පසුව පමණක් ප්‍රරෝහණය වන ජීව්‍ය බීජ ලෙස ය.
5) ජලයේ පෙඟවීමෙන් පසුව පමණක් ප්‍රරෝහණය වන ජීව්‍ය බීජ ලෙස ය. (2008)

(63) වැපිරීමට පෙර වී බීජ පෙඟවීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. බීජ පෙඟවීමෙන්,
A – බීජ පෙඟවීමෙන් ප්‍රරෝහණයට පෙර බීජයට ජලය අවශෝෂණය කර ගැනීම පහසු වේ.
B – බිත්තර වී වලින් හිස් බීජ ඉවත් කිරීමට බීජ පෙඟවීම උපකාරී වේ.
C – බීජ පෙඟවීම මඟින් නිර්වායු තත්ත්ව ලබාදීමෙන් බීජවල සිටින ක්ෂුද්‍රජීවීන් විනාශ වේ.
D – බීජ පෙඟවීම බිත්තර වී වලින් අපිරිසිදු දෑ ඉවත් කිරීමට උපකාරී වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ,
1) A සහ B පමණි. 2) A සහ C පමණි. 3) A සහ D පමණි.
4) B සහ C පමණි. 5) B සහ D පමණි. (2008)

(64) පොතු වළලු ගැසීම සිදු කෙරෙන ශාක ප්‍රචාරණ ක්‍රමය වනුයේ,
1) රිකිලි බද්ධයයි. 2) අතුකැබලි සිටුවීමයි. 3) අතු බැඳීමයි.
4) ක්ෂුද්‍ර ප්‍රචාරණයයි. 5) අංකුර බද්ධයයි. (2009)

(65) බීජ ප්‍රරෝහණය වීම වැළැක්වීම සඳහා වඩාත් සාර්ථක උපාය මාර්ගය වනුයේ,
1) නිපාතනය වැළැක්වීම ය. 2) වියැළීම වැළැක්වීම ය. 3) සංසේචනය වැළැක්වීම ය.
4) බීජ ව්‍යාප්තිය වැළැක්වීම ය. 5) බීජ වර්ධනය වැළැක්වීම ය. (2009)

(66) පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න. බීජයේ කලලය,
A – සිය පෝෂක තමන්ම සපයා ගනියි.
B – පරිණත ශාකයක් බවට වර්ධනය වේ.
C – තුළ ප්‍රරෝහණ අග්‍ර හා මුල් අග්‍ර අඩංගු වේ.
D – තුළ සජීවී කොටස් අඩංගු වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
1) A, B හා C පමණකි. 2) A, B හා D පමණකි. 3) A, C හා D පමණකි.
4) B, C හා D පමණකි. 5) A, B, C හා D සියල්ලම. (2009)

(67) භ්‍රෑණ පෝෂයක් සහිත පරිණත බීජ දැකිය හැක්කේ,
1) බඩඉරිඟු ශාකයේ ය. 2) ලීමා බෝංචි ශාකයේ ය. 3) පී ශාකයේ ය.
4) තක්කාලි ශාකයේ ය. 5) බණ්ඩක්කා ශාකයේ ය. (2009)

(68) බීජ ප්‍රරෝහණයේ දී ප්‍රථම දෘශ්‍ය සලකුණ වනුයේ,
1) බීජාග්‍රපය වර්ධනය වීම ය. 2) බීජ මූලය නිගමනය වීම ය.
3) පසෙන් මතුපිට බීජ පත්‍ර දක්නට ලැබීම ය. 4) බීජාංකුරයේ කලල පත්‍ර දිගහැරීම ය.
5) බීජාග්‍රපය හා බීජ මූලය යන දෙකම වර්ධනය වීම ය. (2009)

(69) පටක රෝපණයේ දී විභේදනය **නොවූ** සෛල බිහිවීම හඳුන්වනු ලබන්නේ,
1) අනුකූලනය වීම (acclimatization) ලෙස ය. 2) ස්ථාපිත වීම (establishment) ලෙස ය.
3) මුල් නිර්මාණය වීම ලෙස ය. 4) කිණක නිර්මාණය වීම ලෙස ය.
5) පුනර්වර්ධනය වීම ලෙස ය. (2009)

(70) වයිරස් ආසාදනය වූ මාතෘ ශාකයකින් කුඩා අග්‍රස්ථ ප්‍රරෝහයක් ගෙන එමගින් වයිරස් රහිත ශාක නිපදවා ගැනීමේ ක්‍රමය හඳුන්වනු ලබන්නේ,
1) විභාජක පටක රෝපණය ලෙස ය. 2) කලල මුදවාගැනීම (embryo rescue) ලෙස ය.
3) දෛහික ක්ලෝන විචලතාව ලෙස ය. 4) පටක ප්‍රගුණනය ලෙස (tissue proliferation)ලෙස ය.
5) සෛල රෝපණය ලෙස ය. (2009)

(71) ඔබගේ පාසලේ කෘෂි විද්‍යාගාරයට, තෙතමනය නිර්ණය සඳහා බීජ වී වී නියැදියක් ලැබී ඇත. ශිෂ්‍යයෙක් මෙම නියැදියෙන් ග්‍රෑම් 200 ක් මැන එය නියත බරකට පැමිණෙන තෙක් උඳුනේ වියළා ගත්තේ ය. උඳුනේ වියළීමෙන් පසු බීජවල බර ග්‍රෑම් 180 ක් විය. මෙම බීජ නියැදියේ තෙතමන ප්‍රමාණය,
1) 10.0% කි. 2) 11.1% කි. 3) 20.0% කි.
4) 36.0% කි. 5) 40.0% කි. (2009)

(72) කුඩා ප්‍රරෝහ අග්‍රස්ථ යොදාගනිමින් වෛරස් **රහිත** ශාක ලබා ගැනීමේ තාක්ෂණය හඳුන්වනුයේ,
1) විභාජක පටක රෝපණය ලෙස ය. 2) කලලය මුදවා ගැනීම ලෙස ය.
3) දෛහික ක්ලෝන විචලතාව ලෙස ය. 4) පටක ප්‍රගුණනය ලෙස ය.
5) දෛහික කලල ජනනය ලෙස ය. (2010)

(73) පටක රෝපණයේ දී විභේදනය නොවූ සෛල ඇතිවීම හඳුන්වනුයේ,
1) අනුකූලනය (acclimatization) ලෙස ය. 2) ක්ලෝනීකරණය (cloning) ලෙස ය.
3) ව්‍යාක්ති – ප්‍රවෘත්තිය (ontogeny) ලෙස ය. 4) ටොටිපොටෙන්සි (totipotency) ලෙස ය.
5) කිරණක (callus) සෑදීම ලෙස ය. (2010)

(74) පටක රෝපණයේ දී වඩාත්ම බහුලව භාවිත වන අර්ධ - ඝන ආධාරකය වනුයේ,
1) ඒගාර් ය. 2) ජිලාර් ය. 3) ස්කුග් ය. 4) මුරාෂිගෙ ය. 5) ප්‍රෝලීන් ය. (2010)

(75) හෙක්ටයාර 2 ක ඉඩමක් හිමි ගොවියෙකුට, හෙක්ටයාරයකට පැළ 55 000 ක් සහිත බඩඉරිඟු වගාවක් ඇරඹීමට අවශ්‍ය වී ඇත. බීජ මර්ත්‍යතා අනුපාතිකය (mortality rate) 10% ක් නම්, ඔහුට අවශ්‍ය බීජ සංඛ්‍යාව වනුයේ,
1) 112 000 කි. 2) 121 000 කි. 3) 122 000 කි. 4) 122 222 කි. 5) 124 222 කි. (2010)

(76) ශිෂ්‍යයෙක්, එක්තරා ශාකයක පුෂ්ප ජීව විද්‍යාව පරීක්ෂාවෙන් අනතුරුව පහත නිරීක්ෂණ සිදු කළේ ය.

- ➢ කුඩා සුදු ද්විලිංගික පුෂ්ප ඇත.
- ➢ කිසිදු ගන්ධයක් හෝ මල්පැණි නොමැත.
- ➢ පරාග බර අතර, කලංකය කුඩා ය.

මෙම ශාකය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,

1) ස්ව පරාගණය වන ශාකයක් ලෙස ය.
2) සුළං මඟින් පරාගණය වන ශාකයක් ලෙස ය.
3) කෘමීන් මඟින් පරාගණය වන ශාකයක් ලෙස ය.
4) පර පරාගණය වන ශාකයක් ලෙස ය.
5) විසංයෝගිත (apomictic) ශාකයක් ලෙස ය. (2010)

(77) සුප්ත බීජ,

1) ජීවිවත අතර, ප්‍රරෝහණයට සුදුසු බාහිර තත්ත්ව සැපයූ විට ප්‍රරෝහණය වේ.
2) ජීවිවත නමුත් ප්‍රරෝහණයට සුදුසු බාහිර තත්ත්ව සැපයුව ද ප්‍රරෝහණය නොවේ.
3) ජීවිවත අතර, ජීවාණුහරණය කළ පසු පමණක් ප්‍රරෝහණය වේ.
4) අජීවිවත අතර, සීරීමෙන් පසුව පවා ප්‍රරෝහණය නොවේ.
5) අජීවිවත අතර, අම්ල ප්‍රතිකර්මවලින් පසුව පවා ප්‍රරෝහණය නොවේ. (2010)

(78) ඒගාර් යනු,

1) පෝෂකයකි. 2) විටමිනයකි. 3) ඝනීකාරකයකි.
4) හෝර්මෝනයකි. 5) අපූතිකාරකයකි. (2011)

(79) කිණිකවල ප්‍රරෝහ ඇති කිරීම සඳහා පටක රෝපණ මාධ්‍යයක භාවිත කරනු ලබන ද්‍රව්‍ය වනුයේ,

1) ABA ය. 2) GA_3 ය. 3) IBA ය. 4) කයිටනින් ය. 5) ඒගාර් ය. (2011)

(80) අභිජනන බීජවල ප්‍රජනිතය වන්නා වූ ද, ඉහළ ප්‍රවේණික අනන්‍යතාවකින් හා පාරිශුද්ධ බවකින් යුක්ත වූ ද, බීජ පංතිය,

1) ජාන විකරණය කළ බීජ වේ. 2) සහතික කළ බීජ වේ. 3) පදනම් බීජ වේ.
4) ලියාපදංචි බීජ වේ. 5) දෙමුහුම් බීජ වේ. (2011)

(81) ඒගාර් යනු,

1) විටමින් වර්ගයකි. 2) පෝෂකයකි. 3) විෂබීජ නාශකයකි.
4) තෙත් කාරකයකි. 5) ඝනීකාරකයකි. (2012)

(82) සිය විශේෂයේ අඛණ්ඩ පැවැත්ම සඳහා සාමාන්‍යයෙන් ශාකයක් සතු වඩාත්ම වැදගත් කොටස වනුයේ,

1) පත්‍ර ය. 2) වල්කය ය. 3) කඳ ය. 4) මුල ය. 5) පුෂ්පය ය. (2012)

(83) ක්ෂේත්‍රයක හට ගන්නා නිරෝගී බීජ පැළ සංඛ්‍යාව රඳා පවතින්නේ,

A – බීජවල ජීව්‍යතාව මත ය.
B – බීජවල පාරිශුද්ධතාව මත ය.
C – බීජ තෙළන අවස්ථාවේ පැවති පාරිසරික තත්ත්ව මත ය.
D – ඒකක ක්ෂේත්‍රඵලයක සිට වූ බීජ සංඛ්‍යාව මත ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,

1) A, B හා C පමණි. 2) A, B හා D පමණි. 3) A, C හා D පමණි.
4) B, C හා D පමණි. 5) A, B, C හා D සියල්ලම ය. (2012)

➢ ප්‍රශ්න අංක 84 ට පිළිතුරු දීම සඳහා පහත රූප සටහන භාවිතා කරන්න.



(84) මෙම රූප සටහනෙහි දක්වා ඇති බද්ධ ක්‍රමය හඳුන්වන්නේ,

1) පැලුම් රිකිලි (Cleft) බද්ධය ලෙස ය.
2) ජිහ්ව (Whip) බද්ධය ලෙස ය.
3) පාලම් (Bridge) බද්ධය ලෙස ය.
4) කුඤ්ඤ (Wedge) බද්ධය ලෙස ය.
5) ආරුක්කු (Approach) බද්ධය ලෙස ය. (2012)

(85) බීජ සුප්තතාව ශාකවලට,
1) අයහපත් කාලගුණ තත්ත්ව මග හැරීමට උදව් වේ.
2) නිරෝගී බීජ පමණක් වර්ධනය කිරීමට උදව් වේ.
3) බීජවල ජීව්‍යතාව අඩු කිරීමට උදව් වේ.
4) බීජ නරක් වීම වළක්වා ගැනීමට උපකාරී වේ.
5) බීජ පළිබෝධ උවදුරුවලින් ආරක්ෂා කර ගැනීමට උදව් වේ. (2013)

(86) ශාක ප්‍රචාරණයේ දී පොතු වළලු ගැසීම සුලබව යොදා ගන්නේ,
1) අංකුර බද්ධයේ දී ය. 2) රිකිලි බද්ධයේ දී ය. 3) අතු බැඳීමේ දී ය.
4) අංකුර හා රිකිලි බද්ධයේ දී ය. 5) අංකුර බද්ධයේ දී හා අතු බැඳීමේ දී ය. (2013)

(87) ක්ෂුද්‍ර ප්‍රචාරණය පැහැදිලි කළ හැක්කේ,
1) බඳුන් තුළ ශාක වැවීම ලෙස ය.
2) මාතෘ ශාකයක ඉතා කුඩා කොටස්වලින් පූර්ණ ශාක ලබා ගැනීම ලෙස ය.
3) හරිතාගාරවල ශාක වගා කිරීම ලෙස ය.
4) පරාගධානිවලින් පූර්ණ ශාක ලබා ගැනීම ලෙස ය.
5) දියගත වගා පද්ධතිවලින් ශාක වගා කිරීම ලෙස ය. (2013)

(88) වයිරසවලින් තොර ශාක නිපදවීමට හොඳම ක්‍රමය වනුයේ,
1) කළල රෝපණය 2) විභාජක පටක රෝපණය 3) ඩිම්බ රෝපණය
4) පරාගධානි රෝපණය 5) පරාග රෝපණය (2014)

(89) කෘත්‍රිම බීජ යනු,
1) කෘත්‍රිම පරාගනය මගින් නිපදවනු ලබන බීජ වේ.
2) ජෙලියක් තුළ රඳවා ආවරණය කළ බීජ වේ.
3) ජෙලියක් තුළ රඳවා ආවරණය කළ යුක්තාණුක කළල වේ.
4) ජෙලියක් තුළ රඳවා ආවරණය කළ දෛහික කළල වේ.
5) විද්‍යාගාර තත්ත්ව යටතේ නිපද වූ බීජ වේ. (2014)

(90) ගැඩවිලුන් විසින් පසෙහි කුහර සෑදමෙන්,
1) පසෙහි ඇති ශාක පෝෂක දිය වේ.
2) පසෙහි ජලවහනය, වාතනය හා පාංශු ව්‍යුහය දියුණු වේ.
3) පසෙහි ජීවත්වන ක්ෂුද්‍ර ජීවීන්ගේ ප්‍රභාසංස්ලේෂණයට උපකාරී වේ.
4) ශාකවලට යාන්ත්‍රික ආධාරකයක් සහ පෝෂක සැපයේ.
5) පසෙහි දෘශ්‍ය ඝනත්වය වැඩි වේ. (2014)

(91) බීජ සුප්තතාව නිසා ශාකවලට,
1) අයහපත් කාලගුණ තත්ත්ව මග හැරීමට අවකාශ ලැබේ.
2) නිරෝගී බීජ බිහි කිරීමට අවකාශ ලැබේ.
3) බීජ ජීව්‍යතාව අඩු කිරීමට අවකාශ ලැබේ.
4) බීජ නරක්වීම වැළැක්වීමට අවකාශ ලැබේ.
5) බීජවලට පරිණත වීමට අවකාශ ලැබේ. (2014)

(92) බිත්තර වී සාමාන්‍යයෙන් පැය 12 කට වඩා ජලයේ පොඟවනු ලැබේ. මෙම ක්‍රියාවේ ප්‍රධාන අරමුණ වනුයේ,
1) බීජ ප්‍රරෝහණය සඳහා ජලය අවශෝෂණය පහසු කිරීම ය.
2) බොල් බීජ ඉවත් කිරීම.
3) බීජය තුළ සිටින ක්ෂුද්‍ර ජීවීන් විනාශ කිරීම සඳහා ඒ තුළ නිර්වායු තත්ත්වයක් ඇති කිරීම ය.
4) වී සමග මිශ්‍රව ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම ය.
5) බීජ සුප්තතාව බිඳ දැමීම ය. (2014)

(93) බොහෝ බීජවල සුප්තතාව බිඳ දැමිය හැක්කේ,
1) ආලෝකයට නිරාවරණය කිරීමෙනි. 2) සීතලට නිරාවරණය කිරීමෙනි.
3) ඝනමනයට නිරාවරණය කිරීමෙනි. 4) නිර්වායු තත්ත්වවලට නිරාවරණය කිරීමෙනි.
5) පාරජම්බුල ආලෝකයට නිරාවරණය කිරීමෙනි. (2015)

(94) කිණකය යනු,
1) කලල ඇති කරනු ලබන පටකයකි.
2) රෝපණය සඳහා යොදා ගන්නා ශාක කොටසකි.
3) අසංවිධානාත්මක සක්‍රීයව විභාජනය වන සෛල සමූහයකි.
4) පූර්වකය මගින් නිපදවනු ලබන අද්‍රාව්‍ය කාබෝහයිඩ්‍රේට් වේ.
5) පටක රෝපණයේ දී ප්‍රරෝහ ඇති කිරීම සඳහා යොදා ගනු ලබන රසායනික ද්‍රව්‍යයකි. (2015)

(95) වර්ධක ප්‍රචාරණය,
1) ස්වාභාවිකව සිදු වන අතර ප්‍රවේණිකව සර්වසම ශාක නිපදවයි.
2) කෘත්‍රිමව සිදු වන අතර ප්‍රවේණිකව සර්වසම ශාක නිපදවයි.
3) කෘත්‍රිමව සිදු වන අතර ප්‍රවේණිකව වෙනස් ශාක නිපදවයි.
4) ස්වාභාවිකව හා කෘත්‍රිමව සිදු වන අතර ප්‍රවේණිකව සර්වසම ශාක නිපදවයි.
5) ස්වාභාවිකව හා කෘත්‍රිමව සිදු වන අතර ප්‍රවේණිකව වෙනස් ශාක නිපදවයි. (2015)

(96) ශාක අභිජනනයේ දී සංසේචනයෙන් පසු පුෂ්ප මංජරියට බෑගයක් යොදනු ලබන්නේ,
1) ස්වපරාගණය වැළැක්වීමට ය.
2) පරපරාගණය වැළැක්වීමට ය.
3) ස්වපරාගණය ප්‍රවර්ධනය කිරීමට ය.
4) අභිමත පරාගණයක් ලබා ගැනීමට ය.
5) බාහිර පරාගවලින් අපවිත්‍ර වීම (Contamination) වැළැක්වීමට ය. (2015)

(97) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත ප්‍රමාණයට වඩා වැඩි බීජ වී ප්‍රමාණයක් වැපිරීමට ගොවියෙකු විසින් තීරණය කරන ලදී. ඔහුගේ තීරණයට වඩාත් බලපෑ හේතුව විය හැක්කේ,
1) සංයුක්ත නෙළන යන්ත්‍ර භාවිතයට පහසුවක් ලෙස ය.
2) පොහොර ලෙස යෙදූ පෝෂක හානිය අවම කිරීම ය.
3) පඳුරු දැමීම අඩුකර ඵලදායී පඳුරු සංඛ්‍යාව වැඩි කිරීම ය.
4) දීර්ඝ කාලීනව පවතින ජල ගැලීම් හා නියං නිසා වන හානිය අවම කර ගැනීම ය.
5) රෝග හා පළිබෝධ නිසා අහිමි වන ධාන්‍ය අස්වැන්න හානිපූරණය කිරීම ය. (2015)

(98) මුල් ඇද්දවීම සඳහා බහුලව යොදා ගන්නා ක්‍රමය වනුයේ,
1) කප්පාදුව
2) පොතු වළලු ගැසීම.
3) රිකිලි බද්ධය
4) අංකුර බද්ධය
5) අතු බැඳීම. (2016)

(99) ටෙට්‍රාසෝලියම් ක්ලෝරයිඩ් (TZ) පරීක්ෂාව සිදු කරන්නේ,
1) බීජ ජීව්‍යතාව මැනීමට ය.
2) බීජ වර්ධනය මැනීමට ය.
3) පරපරාගණය වූ ප්‍රමාණය මැනීමට ය.
4) බීජ සුප්තතාව මැනීමට ය.
5) බීජ පරිණතබව මැනීමට ය. (2016)

(100) පැළෑටි ප්‍රචාරණය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,
1) බීජ ප්‍රචාරණයෙන් ලැබෙන ශාකවලින් ප්‍රවේණික ව සමාන ශාක ලැබේ.
2) ක්ෂුද්‍ර ප්‍රචාරණය වර්ධක ප්‍රචාරණ ක්‍රමයක් ලෙස නොසැලකේ.
3) වර්ධක ප්‍රචාරණයෙන් ලබා ගන්නා ශාක, බීජ ප්‍රචාරණයෙන් ලබා ගන්නා ශාකවලට වඩා ඉක්මනින් මේරීමට පත් වේ.
4) බීජ අල මගින් අර්තාපල් ප්‍රචාරණය, බීජ ප්‍රචාරණ ක්‍රමයක් ලෙස සැලකේ.
5) කෘත්‍රිම බීජ මගින් බෝග ප්‍රචාරණය, බීජ මගින් සෙරෙන ප්‍රචාරණ ක්‍රමයක් ලෙස සැලකේ.
(2016)

(101) බීජ ප්‍රරෝහණයට වඩාත් ම බලපාන සාධක වනුයේ,
1) බීජ ජීව්‍යතාව සහ බීජයේ ප්‍රමාණය ය.
2) බීජයේ හැඩය සහ බීජ 100 ක බර ය.
3) බීජ සුප්තතාව සහ බීජ 100 ක බර ය.
4) බීජයේ ප්‍රමාණය සහ බීජයේ තෙතමන ප්‍රමාණය ය.
5) බීජ ජීව්‍යතාව සහ බීජයේ තෙතමන ප්‍රමාණය. (2016)

7 ඒකකය

ශාක ප්‍රචාරණය

(1)	2	(2)	4	(3)	3	(4)	4	(5)	1	(6)	5	(7)	5	(8)	4
(9)	3	(10)	3	(11)	2	(12)	2	(13)	3	(14)	3	(15)	3	(16)	3
(17)	5	(18)	3	(19)	2	(20)	4	(21)	4	(22)	1	(23)	4	(24)	5
(25)	3	(26)	3	(27)	3	(28)	4	(29)	4	(30)	3	(31)	4	(32)	1
(33)	1	(34)	3	(35)	5	(36)	4	(37)	1	(38)	3	(39)	3	(40)	4
(41)	2	(42)	3	(43)	5	(44)	1	(45)	2	(46)	3	(47)	1	(48)	5
(49)	5	(50)	1	(51)	3	(52)	3	(53)	2	(54)	4	(55)	5	(56)	1
(57)	5	(58)	2	(59)	5	(60)	1	(61)	5	(62)	2	(63)	1	(64)	3
(65)	1	(66)	4	(67)	1	(68)	2	(69)	4	(70)	1	(71)	1	(72)	1
(73)	5	(74)	1	(75)	4	(76)	1	(77)	2	(78)	3	(79)	3	(80)	3
(81)	5	(82)	5	(83)	3	(84)	3	(85)	1	(86)	3	(87)	3	(88)	2
(89)	4	(90)	4	(91)	1	(92)	1	(93)	3	(94)	3	(95)	4	(96)	5
(97)	3	(98)	5	(99)	1	(100)	3	(101)	5						